# කොවිඩ්-19 ව්‍යාප්තිය වළක්වමින් පොදු මහජන සහ වෘත්තිය ක්‍රියාකාරකම් සිදුකරන ආකාරය පිළිබඳව උපදෙස්

පොදු මහජන සහ වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා උපදේශ සටහන් ලබා දී ඇත. සංචාරක සේවා, විශාල සාප්පු සංකීර්ණ, උත්සව කළමනාකරණය වැනි සමහර අංශවලට උපදෙස් සටහන් කිහිපයක් අදාළ වේ.

මෙම උපදෙස් කාර්යයන් නැවත ආරම්භ කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබා දී ඇති සමස්ත අවසරයට යටත් වේ (මුළුමනින්ම / තෝරාගත්).

සෑම උපදෙස් සටහනක්ම සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ලබයි. කොවිඩ්-19 සම්ප්‍රේෂණය වැළක්වීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ආයතන හිමිකරු / වගකිවයුතු පුද්ගලයා වෙත ඉදිරිපත් කර ඇත.

වෘත්තීය ක්‍රියාකාරකම් සඳහා වැඩිදුර තොරතුරු ලබා ගැනීමට - කරුණාකර

http://eohfs.health.gov.lk/occupational/index.php?option=com_content&view=article&id=61&Itemid=208&lang=en වෙත යොමු වන්න.

නව ජීවන රටාවක් උදෙසා
புதிய வாழ்க்கை முறையை நோக்கி
TOWARDS A NEW NORMAL

සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය

World Health Organization Sri Lanka

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

## 37.වීදි වෙළෙන්දන් (ස්ථාවර සහ ජංගම)

වීදි වෙළඳුන් ශ්‍රී ලංකාවේ සුලභ දසුනකි. වීදි වෙළෙන්දෙකු යනු වීදි, ඇවිදින මංතීරු අසල, අඩිපාරවල, පදික වේදිකාවල, පොදු උද්‍යානයක හෝ වෙනත් පොදු ස්ථානයක හෝ පෞද්ගලික ස්ථානයක භාණ්ඩ, ආහාර ද්‍රව්‍ය හෝ එදිනෙදා භාවිතා වන වෙළඳ භාණ්ඩ හෝ විකුණා සාමාන්‍ය ජනතාවට සේවා සැපයීමෙහි නිරතවන පුද්ගලයෙකි. තාවකාලිකව ගොඩනගන ලද ව්‍යුහයකින් හෝ ස්ථානයෙන් ස්ථානයට යාමෙන්, වීදි වෙළෙන්දන්ගේ ප්‍රමිතීන් පිළිබඳව සොයා බැලීමට ශ්‍රී ලංකාවේ සෑම මහ නගර සභාවකම කමිටුවක් පත් කිරීම තරයේ නිර්දේශ කෙරේ. තවද, සෑම වීදි වෙළෙන්දෙකුටම පරිසරය පිරිසිදුව තබා ගැනීමට සහ සෞඛ්‍යාරක්ෂිත තත්වයන් පවත්වා ගැනීමට ඇති වගකීම පිළිබඳව දැනුවත් කළ යුතුය.

**සංවිධායක - මහ නගර සභාව / පරිසර ආරක්ෂණ අධිකාරිය**

- වීදි වෙළෙන්දන්ගේ ගැටළු විසඳීම සඳහා නාගරික මහ නගර සභාවල වෙනම අංශයක් පිහිටුවීම.
- ජංගම වීදි වෙළෙන්දන් සහ ප්‍රදේශ පරීක්ෂා කිරීම හා වෙන් කිරීම සඳහා අංශයක් / කමිටුවක් පිහිටුවීම සහ වෙළඳාම් ප්‍රදේශය ලකුණු කිරීම.
- ස්ථාවර වීදි වෙළෙන්දන් පාරිභෝගිකයින් අතර අතර ශාරීරික දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් නියමිත ඉඩක් ඇති බව සහතික කිරීම.
- පළාත් පාලන ආයතන සමඟ එකතුවී වීදි වෙළෙන්දන් ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ඇති කිරීම - සියලුම වෙළෙන්දන්ගේ සම්බන්ධතා තොරතුරු.
- අවශ්‍ය පූර්වාරක්ෂාවන් වෙළෙන්දා විසින් ගනු ලබන බවට සහතික වීම  උදා. දෑත් පිරිසිදුව තබා ගැනීම, ශ්වසන ආචාර විධි, මුහුණු ආවරණ ආදිය.
- වෛරසය පැතිරෙන ආකාරය සහ වැළැක්වීමේ ක්‍රියාමාර්ග පිළිබඳව වෙළෙන්දන්, පාරිභෝගිකයින් දැනුවත් කිරීම සඳහා නිරතුරුව වැඩසටහන් සංවිධානය කිරීම, (ශාරීරික දුරස්ථභාවය, ශ්වසන ආචාර විධි, මුහුණු ආවරණ නිසි ලෙස පැළඳීම, දෑත් පිරිසිදුව තබා ගැනීම).
- ලබා දී ඇති උපදෙස් වලට අනුකූල බව දක්වමින් ඔබ විසින් එකඟතා ප්‍රකාශය පිරවිය යුතුය. සම්පූර්ණ කරන ලද එකගතා ප්‍රකාශයේ මුල් පිටපත ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා  වෙත යැවිය යුතුය. එහි පිටපතක් අදාළ පළාත් පාලන ආයතනයට (මහ නගර සභාව / නගර සභාව / ප්‍රාදේශීය සභාව) යැවිය යුතු අතර තවත් පිටපතක් තමන්  සතුව තබා ගත යුතුය. ඉහත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම හිමිකරුගේ  වගකීම වේ.

**විකුණුම්කරුවන්**

- වෛරසය පැතිරෙන ආකාරය සහ වැළැක්වීමේ පියවර දැන සිටිය යුතුය.
- සෑම විටම පාරිභෝගිකයින්ගෙන් මීටර් 1 ක දුරක් පවත්වා ගත යුතුය.
- මුහුණු ආවරණ නිසි ලෙස පැළඳිය යුතුය, හදිසි අවස්ථා සඳහා අමතර මුහුණු ආවරණක් ලග තබා ගත යුතුය.
- මුදල් පරිහරණයේදී හැකි සෑම විටම දෑත්  නිතර විෂබීජහරණය කිරීම ඇතුලු ආරක්ෂිත පූර්වෝපායන් දැන සිටිය යුතුය.
- ඔවුන්ගේ වාහනය හෝ වෙළඳාම් උපකරණ  විෂබීජහරණය කළ යුතුය.
- අසනීප නම් නිවසේ සිටිය යුතුය.

**නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙල**

- දැන්වීම් / පෝස්ටර.
- සංඥා.



සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.